*සැ. යු.-* 2025.07.18 වැනි දින පළ කරන ලද අංක 2446 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,447 - 2025 ජූලි මස 25 වැනි සිකුරාදා - 2025.07.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 156 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 158 |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 15 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඬිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

**කොළඹ දිසා අධිකරණයේ දී ය.**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පී. එල්. සී.,
අංක 84,
වෝඩ් පෙදෙස,
කොළඹ 07.

............*පැමිණිලිකරු.*

නඩු අංකය : DMB/201/2018
ඇස්කිසි අංකය : 33/23
ස්වභාවය : *උකස්*
වටිනාකම : රු. 2,944,138.24/-

*- එදිරිව -*

සිව්රැල්ලේ ගෙදර දමිත් සසංග නවරත්න,
අංක 88/15/1, රන්දෙනිය, පිටවලවත්ත,
ගෙලිඔය.

................*විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ ඇතුළත් 2022 ක් වූ අගෝස්තු මස 31 වැනි දින විත්තිකරු විසින් ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව,

*(අ)* ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට රුපියල් විසිනව ලක්ෂ හතලිස් හතර දහස් එකසිය තිස් අටයි ශත විසි හතරක (රු. 2,944,138.24) මුදල හා ඒ මත පොළිය ගෙවීම පැහැර හැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබා දෙන ලෙසටත්,

*(ආ)* විත්තිකරු විසින් ඉහත රුපියල් විසිනව ලක්ෂ හතලිස් හතර දහස් එකසිය තිස්අටයි ශත විසිහතරක (රු. 2,944,138.24) යන මුදල හා නෛතික පොළිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. ඒ. ආර්. දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 00362508394 දරන හිමිකම් සහතිකය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝගයක් ලබා දෙන ලෙසටත්,

*(ඇ)* නඩු ගාස්තු ලබා දෙන ලෙසටත්,

සමථය පරිදි ගෙවිය යුතු රුපියල් 3,750,000/- මුදලින් ගෙවා ඇති රුපියල් 75,000/- ක මුදල අඩු කර ඉතිරි මුදල වන රුපියල් 3,675,000/- ක මුදල අයකර ගැනීමටත්, දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ අගෝස්තු මස 19 වැනි දින පෙ. ව. 11.00 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| පළාත | : | මධ්‍යම |
| දිස්ත්‍රික්කය | : | මහනුවර |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | උඩුනුවර |
| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | : | පොල්ගහඅංග |
| ගම | : | පොල්ගහඅංග |
| කඩඉම් සිතියම් අංකය | : | 320240 |

| | | |
|---|---|---|
| කලාප අංකය | : | 04 |
| කැබලි අංකය | : | 0099 |
| ඉඩමේ විශාලත්වය | : | 0.0885 (හෙක්ටයාර්) |
| හිමිකම් ප්‍රමාණය | : | සම්පූර්ණ |

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්තිරු C 190/118 හි ලියාපදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

01. වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මුදලෙන් 25% එම අවස්ථාවේ දීම ගෙවිය යුතුය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ මෙම නඩුවට අදාළව තැන්පත් කළ යුතුය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මහනුවර.

වර්ෂ 2025 ක් වූ ජූලි මස 11 වැනි දින දී ය.

07-830

---

### මහර දිසා අධිකරණයේ දී ය

### පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ අංක 59 (01) (ආ) සහ 59 (03) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
වලව්වත්ත,
කිඩගම්මුල්ල,
ගම්පහ.

............*පෙත්සම්කරු.*

| | |
|---|---|
| නඩු අංකය | : 97/විශේෂ |
| ස්වභාවය | : විශේෂ |
| වටිනාකම | : රු. 770,803/- |
| ඇස්කීසි අංකය | : |

*- එදිරිව -*

1. ගනේගොඩ අප්පුහාමිලාගේ සුධර්මා නිල්මිණී,
අංක 42,
මීගහවත්ත,
දෙල්ගොඩ.

2. විතානපතිරන්නැහැලාගේ තනුරුද්ධිකා උදයකාන්ති,
අංක 32/7,
මීගහවත්ත,
දෙල්ගොඩ.

3. කිරිබත්ගොඩගෙ චිත්‍රා රංජනී,
අංක 253/1,
මීගහවත්ත,
දෙල්ගොඩ.

...............*වගඋත්තරකරුවන්.*

ඉහත අංක දරන නඩුව වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින මහර දිසා අධිකරණය ඉදිරියේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශයට අනුව ඉහත කී 01 වන වගඋත්තරකරුගෙන් පෙත්සම්කරු වෙත අයකර ගැනීම සඳහා නියමිත මුදල වන රුපියල් හත්ලක්ෂ හැත්තෑදහස් අටසිය තුනයි (රු. 770,803.00) ක මුදල සහ එකී මුදල ගෙවා අවසන් වන තෙක් 2017.06.27 දින සිට මුල් මුදලට වාර්ෂිකව සියයට දහඅට (18%) ක පොලියක් ද නඩු ගාස්තු සහ නීතිඥ ගාස්තු ද, අයකර ගැනීමට දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත. එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් 01 වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2025ක් වූ අගෝස්තු මස 21 වැනි දින පෙ. ව. 11.00 ට,**

ඉහත නම් සඳහන් 01 වන විත්තිකරුගේ නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල සීමාව තුළ බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මීගහවත්ත අක 272 ඒ බටහිර ග්‍රාම නිලධාරි වසමෙහි මීගහවත්ත ගම තිබෙන "ඇම්බුල්ලගහවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. උපාලි ඩී. රණසිංහ විසින් වර්ෂ 2012 ක් වූ මැයි මස 14 වැනි දින මැන බෙදා සාදන ලද අංක 1971 දරන ප්ලෑනය "කැබලි 1ඒ" දරන කොටසට මායිම්- උතුරට : අඩි 12ක් පළල පාර ද, නැගෙනහිරට : අංක 113/96 දරන පිඹුරේ කැබලි අංක 2 ද, දකුණට සහ බස්නාහිරට : අංක 113/96 දරන ප්ලෑනයේ නිරූපිත මෙම ඉඩමේ ඉතිරි කොටස ද, යන මේ තුළ පිහිටි පර්චස් දහතුන (පර්. 13.00) ක් *හෙවත්* හෙක්ටයාර් 0.0328 ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලු දෙය ද සමග වේ.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මහර.

වර්ෂ 2025 ක් වූ ජූලි මස 07 වැනි දින දී ය.

07-812

---

# විවිධ දැන්වීම්

**පෙත්සම පිළිබඳ දැන්වීම**

සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය.

නඩු අංකය : HC/Civil/27/2025/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම

බ්‍රවුන්ස් පයිලින් (පුද්ගලික) සමාගම (කලින් : "සියරා පයිලින් (පුද්ගලික) සමාගම" යනුවෙන් නම් කර හඳුන්වනු ලැබූ) අංක 112, හැව්ලොක් පාර, කොළඹ 05.

2007 අංක 07 දරන සමාගම් පනතේ XII පරිච්ඡේදය යටතේ සහ ප්‍රකාරව කරනු ලබන අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වන අයදුම් පතක් පිළිබඳ කාරණාවේ දී ය.

01. වීරසිංහ මුදියන්සේලාගේ ඉන්දික සුසන්ත වීරසිංහ,
අංක 145, දඹවෙල, ගුරුදෙණිය.

වීරසිංහ මුදියන්සේලාගේ රොෂාන් ප්‍රසන්න වීරසිංහ,
අංක 228/F, යක්දෙහිගෙදර වත්ත, දඹවෙල පාර, ගුරුදෙණිය.

ගුරුදෙණිය, දඹවෙල, අංක 145 දරන ස්ථානයේ පිහිටි "වීරසිංහ කන්ස්ට්‍රක්ෂන්" නම සහ විලාශය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ඉදිකිරීම් කටයුතු කරගෙන යන අය.

සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා පෙත්සම්කරුවන් වන අංක 145, දඹවෙල ගුරුදෙණියෙහි පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ ඉන්දික සුසන්ත වීරසිංහ සහ අංක 228/F, යක්දෙහිගෙදර වත්ත, දඹවෙල පාර, ගුරුදෙණියෙහි පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ රොෂාන් ප්‍රසන්න වීරසිංහ යන අය විසින් 2025 මැයි මස 21 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2025 අගෝස්තු මස 06 වැනි දින එකී අධිකරණය ඉදිරිපස ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධයක් හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණයහිමියකු හෝ දායකයකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥ මහතෙකු හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියම කර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ ණයහිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ නම : ඩී. එම්. දනුෂිකා ජී. දිසානායක,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ,
ලිපිනය : අංක 41/D, බෙල්මන් වීදිය, කොළඹ 12.

*සටහන.-* එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයකු එසේ කිරීමට ඇති ඔහුගේ අදහස ඉහත නම් සඳහන් නීතිඥවරිය වෙත ලිඛිතව හෝ තැපැල් මගින් භාරදිය යුතුය. තැපැල් මගින් එවීම අවශ්‍ය වන පුද්ගලයින්ගේ නම සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම් එහි නම සහ ලිපිනය නොතිසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එය පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔහුගේ ලේඛනගත නීතිඥයන් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීම හා එය 2025 අගෝස්තු මස 04 වැනි දින පස්වරුවේ වෙලාව 6.00 ට පෙර ඉහත නම් සඳහන් අයට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර කිරීමට හෝ තැපැල් කරනුයේ නම් එසේ කිරීමට අවශ්‍ය වේ.

නීතිඥ ඩී. එම්. දනුෂිකා ජී. දිසානායක,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

07-815

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.